# 8 සදිශ සංඛ්‍යා

- **නිපුණතාව 1** : එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා තාත්වික සංඛ්‍යා කුලකය තුළ ගණිත කර්ම හසුරුවයි.
- **නිපුණතා මට්ටම 1.1:** දිශාව පිළිබඳ අවබෝධයෙන් සදිශ සංඛ්‍යා ආකලනය කරයි.
- **ඉගෙනුම් පල**
  - සංඛ්‍යා රේඛාව මත පිහිටි සංඛ්‍යාවක්, මූල ලක්ෂ්‍යයේ සිට යම් දුරකින් හා දිශාවකින් පිහිටන බව නිරූපණය කිරීම සඳහා ධන හෝ ඍණ ලකුණ සහිත ව ලියනු ලබන සංඛ්‍යා, සදිශ සංඛ්‍යා ලෙස ප්‍රකාශ කරයි.
  - ධන නිඛිල දෙකක එකතුව, ධන නිඛිලයක් බව සංඛ්‍යා රේඛාව භාවිතයෙන් ප්‍රකාශ කරයි.
  - ඍණ නිඛිල දෙකක එකතුව, ඍණ නිඛිලයක් බව සංඛ්‍යා රේඛාව භාවිතයෙන් ප්‍රකාශ කරයි.
  - අසමාන ලකුණු සහිත නිඛිල දෙකක එකතුව, එම නිඛිල දෙකෙහි අගයන්හි වෙනස බව සංඛ්‍යා රේඛාව භාවිතයෙන් ප්‍රකාශ කරයි.
  - අසමාන ලකුණු සහිත නිඛිල දෙකක එකතුවේ ලකුණ, එම නිඛිල දෙකෙහි අගයෙන් විශාල නිඛිලයේ ලකුණ බව පිළිගනියි.
  - සංඛ්‍යා රේඛාව භාවිතයෙන් නිඛිල ආකලනය කරයි.
  - සංඛ්‍යා රේඛාව භාවිතයෙන් තොර ව සදිශ සංඛ්‍යා ආකලනය කරයි.

**ගුරුවරයාට අදහසක්**

දිශාව සහිතව + හෝ - ලෙස සංඛ්‍යා දැක්වීමේ දී ඒවා සදිශ සංඛ්‍යා ලෙස හඳුන්වන අතර ධන සංඛ්‍යාවක දී + ලෙස දිශාව නොපෙන්වුව ද එය ධන සංඛ්‍යාවක් ලෙස සලකයි. සදිශ සංඛ්‍යා ආකලනයේ දී පිළිතුරෙහි ලකුණ, ආකලනය වන සංඛ්‍යාවල ලකුණු මත රඳා පවතී.

**ඉගෙනුම් පල**

- ධන නිඛිල දෙකක එකතුව, ධන නිඛිලයක් බව සංඛ්‍යා රේඛාව භාවිතයෙන් ප්‍රකාශ කරයි.
- ඍණ නිඛිල දෙකක එකතුව, ඍණ නිඛිලයක් බව සංඛ්‍යා රේඛාව භාවිතයෙන් ප්‍රකාශ කරයි.
- අසමාන ලකුණු සහිත නිඛිල දෙකක එකතුව, එම නිඛිල දෙකෙහි අගයන්හි වෙනස බව සංඛ්‍යා රේඛාව භාවිතයෙන් ප්‍රකාශ කරයි.
- අසමාන ලකුණු සහිත නිඛිල දෙකක එකතුවේ ලකුණ, එම නිඛිල දෙකෙහි අගයෙන් විශාල නිඛිලයේ ලකුණ බව පිළිගනියි.
- සංඛ්‍යා රේඛාව භාවිතයෙන් නිඛිල ආකලනය කරයි.

⌘ මේ සඳහා ක්‍රියාකාරකම් එකක් පහතින් දැක් වේ.

⌘ 7 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 61, 62 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න.

**ක්‍රියාකාරකම 01**

**ගුණාත්මක යෙදවුම්**

- කණ්ඩායමකට ඇමුණුම 8.1.1 හි සඳහන් කාර්ය පත්‍රිකා 02ක්
- කණ්ඩායමකට එක බැගින් ද්වාදසතලයක් (-5 සිට +6 තෙක් සංඛ්‍යා සටහන් කරන ලද)